අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/03/56/02/03

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022.01. 12

.......................................................................

.......................................................................

.......................................................................

**"අධ්‍යාපන පර්යාලෝක" පර්යේෂණ ජර්නල ප්‍රකාශනය - 2022**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන "අධ්‍යාපන පර්යාලෝක" පර්යේෂණ ජර්නලයේ 2022 කලාප සඳහා අධ්‍යාපන පර්යේෂණ හා අධ්‍යයනයන්හි නිරත විද්‍යාර්ථීන්ගේ ලිපි කැඳවනු ලැබේ. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ හා ගුණාත්මක සංවර්ධන ක්‍රියාවලියේ දී වැදගත් වන අගනා පර්යේෂණ සොයා ගැනීම් අනාවරණය කිරීම මෙම ප්‍රකාශනයේ මූලික අරමුණ යි.

ජාතික මට්ටමින් අධ්‍යාපනය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් හට උචිත ලිපි සඳහා මෙම ප්‍රකාශනය විවෘතව ඇත. නිදසුන් වශයෙන් ඉහළ ගුණාත්මකභාවයකින් යුත් පර්යේෂණ පත්‍රිකා, සමීක්ෂණ වාර්තා, අධ්‍යයන වාර්තා, බලපෑම් ඇගයීම්, සුසමාදර්ශ පිළිබඳ වෘත්තාන්ත සහ සංඛ්‍යාලේඛන විග්‍රහ ආදියට මෙහි ප්‍රමුඛතාව හිමිවේ.

**අත් පිටපත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි හෝ යන ඕනෑ ම මාධ්‍යයකින් ඉදිරිපත් කළ හැකි අතර එහි දී සැලකිලිමත් විය යුතු කරුණු පසුපිටෙහි සවිස්තරාත්මක ව දක්වා ඇත.**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරනු ලබන විද්වතුන්ගෙන් සමන්විත සංස්කාරක මණ්ඩලයක සමීක්ෂණයට යටත් වේ. සමීක්ෂක මණ්ඩලයේ විචාර සහ යෝජනා අනුව අවශ්‍ය සංශෝධන කර නැවත අත් පිටපත් ඉදිරිපත් කිරීම පිණිස කර්තෘ වෙත දන්වා එවනු ඇත. පර්යේෂණ / අධ්‍යයන ලිපියක් ප්‍රකාශනය පිණිස තෝරා ගනු ලැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව කර්තෘ / කර්තෘවරුන් දැනුවත් කරනු ඇත.

ජර්නලය සඳහා භාර දෙනු ලබන ලිපි මීට පෙර ප්‍රකාශයට පත් කළ ඒවා නොවිය යුතු අතර අදාළ ලිපි, මෙම ප්‍රකාශනයට සමගාමී ව වෙනත් කිසිදු තැනකට භාර දීම හෝ ප්‍රකාශයට පත් කිරීම හෝ නොකළ යුතු බව ප්‍රකාශනයට අදාළ කොන්දේසියක් වේ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ අත් පිටපතක් ප්‍රකාශනය සඳහා අනුමතවීම තුළින් ලිපියේ ප්‍රකාශන අයිතිය කර්තෘ විසින් ප්‍රකාශක වෙත මාරු වූ බවට කර්තෘගේ එකඟතාව පළ කිරීමක් ලෙස සැලකේ. (ප්‍රකාශන අයිතිය මගින්, ප්‍රකාශනයේ හිමිකරු වෙතින් ලබා ගත් ලිඛිත අවසරයකින් තොරව නැවත මුද්‍රණය, ඡායාරූපකරණය, මයික්‍රෝ ෆිල්ම් ආකාරයට පිටපත් කිරීම හෝ කිසිදු ආකාරයකට ලිපිය නැවත මුද්‍රණය කිරීමට හෝ බෙදා හැරීමට හෝ ඇති සියලු අයිතීන් අවුරනු ලැබේ.)

"අධ්‍යාපන පර්යාලෝක" මීළඟ කලාපවල ලිපි පළ කිරීමට උනන්දුවක් දක්වන ඔබ ආයතනයේ /පළාතේ විද්‍යාර්ථීන් වෙත මෙම පණිවුඩය ලබා දෙන මෙන් ඉතා කාරුණිකව දැනුම් දෙමි.

මේ පිළිබඳව ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

M.M.Wehella

**ආචාර්ය මදුරා. එම්. වෙහැල්ල**
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

කරු. අ.පි.බ. →

**"අධ්‍යාපන පර්යාලෝක " පර්යේෂණ ජර්නලය වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

*මීට පෙර මේ සම්බන්ධව නිකුත් කර ඇති සියලු උපදෙස් අභිබවා මෙම උපදෙස් 2022.01.01 දින සිට ක්‍රියාත්මක වේ.*

*නම හෝ කර්තෘ හෝ පිළිබඳ වෙනත් කිසිදු තොරතුරක් ආවරණ ලිපියෙහි හැර අත් පිටපතෙහි කිසිදු තැනක සඳහන් නොකළ යුතුය.*

*පහත සඳහන් තොරතුරු ආවරණ ලිපිය මගින් ඉදිරිපත් කළ යුතුය.*

- *කර්තෘ පිළිබඳ තොරතුරු (නම, තනතුර, රාජකාරී ලිපිනය ආදි ........)*
- *සම්බන්ධ කර ගත හැකි තොරතුරු (දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපිනය ආදිය ................)*
- *කර්තෘ පිළිබඳ කෙටි විස්තරයක් (අධ්‍යාපන සුදුසුකම්, ප්‍රකාශන යනාදිය .........)*

1. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි බසින් හෝ ඉදිරිපත් කරනු ලබන ලිපියෙහි අන්තර්ගතය පහත ආකාරයට පෙළ ගස්වා තිබිය යුතුය.
   (i) සාරාංශය : මුඛ්‍ය වචන 3 ක් ඇතුළත්ව වචන 150 – 200
   (ii) හැඳින්වීම : ගැටලුවෙහි ස්වභාවය, පසුබිම, තාර්කිකය
   (iii) සාහිත්‍ය විමර්ශනය : සෛද්ධාන්තික හා ප්‍රායෝගික පසුබිම
   (iv) ක්‍රමවේදය : අරමුණු,අරමුණු ළගා කර ගැනීමේ ක්‍රමෝපාය, දත්ත රැස් කිරීමේ ක්‍රම, විශ්ලේෂණය හා විග්‍රහය
   (v) සාකච්ඡාව, අර්ථකථන හා සොයා ගැනීම්
   (vi) නිගමන
   (vii) යෝජනා හා නිර්දේශ
   සමස්ත ලිපිය වචන 6000 නොඉක්මවිය යුතු ය.

2. සටහන්, පින්තූර, ඡායාරූප, සිතියම් හා ප්‍රස්තාර යනාදී ආධාරක ද්‍රව්‍ය (උපරිම 4 ක්) මුද්‍රණයට උචිත ඉහළ තත්ත්වයෙන් සහ ප්‍රකාශන අයිතීන් පිළිබඳ ගැටලුවලින් තොරව ඉදිරිපත් කළ යුතු ය. පිටු එකකට වඩා දිග සංඛ්‍යා ලේඛන වගු අංකනය කර ලිපිය අවසානයේ ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතු ය.

3. පාද සටහන් (Foot notes) පිළි නොගන්නා අතර ලිපිය අවසානයට එකතු කරනු ලබන අංකනය කරන ලද සටහන් පමණක් පිළිගනු ලැබේ.

4. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ලිපියෙහි අවසානයට යෙදීමේ දී ඇමෙරිකානු මනෝවිද්‍යාත්මක සංගමයේ 6 වෙනි සංස්කරණයෙහි උපදෙස් අනුගමනය කරන්න. [කරුණාකර www.bibme.org/citation-guideයන වෙබ් අඩවියේ "Useful Guide to APA Format"මාතෘකාව යටතේ ඇති නිදසුන් බලන්න]

5. පිටුවේ ප්‍රමාණය හා ආකෘතිය පහත සඳහන් පරිදි විය යුතු ය.
   A 4 ප්‍රමාණයේ කඩදාසිවල වටේ තීරු මි.මී.25 වන පරිදි පේළි ද්විත්ව පරතරය සහිතව තනි පැත්තේ මුද්‍රණය කළ යුතුය.
   පරිගණක අක්ෂර: පෙළ 12pt උපශීර්ෂ 14pt ශීර්ෂ 16pt වන පරිදි
   සිංහල : FM Abaya දෙමළ : Kalaham ඉංග්‍රීසි : Times New Roman

6. අත් පිටපත් භාර දීම
   දෘඪ පිටපත් දෙකක්, MS Word පැකේජයෙන් සකස් කරන ලද (PDFගොනුවකට පරිවර්තනය නොකළ) මෘදු පිටපතක් ද සමග **2022 මාර්තු 15** දිනට පෙර පහත ලිපිනයට එවිය යුතු ය.

   අධ්‍යාපන අධ්‍යක්ෂ,
   පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   "ඉසුරුපාය",
   පැලවත්ත,
   බත්තරමුල්ල.

මෘදු පිටපත research4d.moe@gmail.comයන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරනු ලබන විද්‍යුත් තැපෑලක ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. (කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ දෘඪ පිටපත් ලබාදීමට නොහැකි නම් මෘදු පිටපත් පළමුව ලබාදී පසුව දෘඪ පිටපත් ලබාදීමට කටයුතු කරන්න.) විද්‍යුත් තැපෑලේ මාතෘකාව (Topic) Education Perspective – 2022 ලෙස යෙදීමට කටයුතු කරන්න.